# මේජර් ජෙනරාල් කේ එම් පි එස් බි කුලතුංග ආර්එස්පි එන්ඩිසි පීඑස්සි

මේජර් ජෙනරාල් ප්‍රදිප් කුලතුංග ජ්‍යෙෂ්ඨ නිලධාරි තුමන් 1971 ජුනි මස 30 වන දින උපත ලබා දිවයිනේ කිර්තිමත් විදුහලක් වු මහනුවර ධර්මරාජ විද්‍යාලයෙන් උසස් අධ්‍යාපනය හදාරා එම පාසලට විවිධ අංශයන්ගෙන් ගෞරවය හා කීර්තිය ලබාදුන් දිප්තිමත් ශිෂ්‍යයෙකු විය.

කුඩාකල පටන් රටදැය පිළිබඳ මෙතුමාගේ තිබු බලවත් කැමැත්ත මත 1990.09.07 දින ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැදී පකිස්ථාන යුද්ධ හමුදා විද්‍යාපීඨයෙන් පාඨමාලා අංක 02 යටතේ යුද්ධ හමුදා පුහුණුව ලැබීමෙන් පසු මෙතුමන් 1991.03.13 දින අධිකාරියට පත්ව දෙවන ලුතිනන් වරයෙකු ලෙස" දෛවයේ කැඳවුම කොතනද" යන්න තේමා පාඨය පෙරදැරි කරගත් ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අභිමානවත් රෙජිමේන්තුවක් වන ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය වෙත එක්විය.

දසක 3 කට අධික යුද්ධ හමුදා සේවා කාලයක් තුළදි මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් තම රෙජිමේන්තුව තුළ හොබවනු ලැබු තනතුරු ලෙස

- රැළි නිළධාරි - 1 ශ්‍රීලසසබ
- රැළි නිළධාරි - 4 ශ්‍රීලසසබ
- විධායක අධිකාරි - 4 ශ්‍රීලසසබ
- බලඝනාදි පති - 3 ශ්‍රීලසසබ
- බලඝනාදි පත - 5 ශ්‍රීලසසබ
- අණදෙන නිලධාරී - 6 ශ්‍රීලසසබ
- අණදෙන නිලධාරී - 4 ශ්‍රීලසසබ යන තනතුරු දැක්විය හැක

තවද මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් යුද්ධ හමුදාව තුළ

- බලසේනා මේජර් - සන්නද්ධ බලසේනා මුලස්ථානය
- ප්‍රධාන උපදේශක - සන්නද්ධ බලකා පුහුණු මධ්‍යස්ථානය
- ප්‍රධාන මාණ්ඩලික නිලධාරි1 - ආරක්ෂක සේනා මුලස්ථානය (මුලතිව්)
- සේනාවිධායක - සන්නද්ධ බලකා පුහුණු මධ්‍යස්ථානය
- ආරක්ෂක සේවා අණ හා මාණ්ඩලික විද්‍යාලයේ උපදේශක නිළධාරි
- මාණ්ඩලික නිලධාරි 1 (සැලසුම්) - සැලසුම් අම යුහමු
- කර්නල් (ප්‍රමානි) - 22 පාබල සේනාංක මුලස්ථානය
- සහකාර යුධ සේවා ලේකම් 3 - යුධ සේවා ලේකම් ශාඛාව

- සහකාර යුධ සේවා ලේකම් 2 - යුධ සේවා ලේකම් ශාඛාව
- බලසේනාධිපති - 541 පාබල බලසේනා මූලස්ථානය
- අධ්‍යක්‍ෂක ජෙනරාල් - මනෝවිද්‍යා මෙහෙයුම් අධ්‍යක්‍ෂ මණ්ඩලය
- සේනාංකාධිපති - 54 පාබල සේනාංක මූලස්ථානය
- අධ්‍යක්‍ෂක ජෙනරාල් - පුහුණු අධ්‍යක්‍ෂක මණ්ඩලය
- යුධ සේවා ලේකම් - යුධ සේවා ලේකම් ශාඛාව

යනාදි වශයෙන් අණ, මාණ්ඩලික හා උපදේශක තනතුරු ගණනාවක් හොබවා යුද්ධ හමුදාව වෙත තම සක්‍රිය දායකත්වය ලබාදී ඇත.

තවද මෙම අභිත ජ්‍යෙෂ්ඨ නිළධාරී වර්ෂ 1991 මැයි මස 29 දින යාපනය ප්‍රදේශයේ ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෙතින් සන්නද්ධ රථ යොදාගෙන සිදුකරන ලද ප්‍රථම ක්‍රියාන්විතය වූ චන්ඩ මාරුතය ක්‍රියාන්විතය සඳහා රැළි නිලධාරියෙකු වශයෙන් තම සක්‍රිය දායකත්වය සපයා ඇත.

එමෙන්ම, 1995.10.22 දින යාපනය අර්ධද්වීපය මුදාවා ගැනිමේ අරමුණින් දියත් කරන ලද රිවිරැස මෙහෙයුම සඳහා තම සක්‍රිය දායකත්ව ලබාදීමේදී වූ ක්‍රියාන්විත තුවාල හේතුවෙන් දේශපුත්‍ර සම්මානයේ මෙම ජ්‍යෙෂ්ඨ නිලධාරී පිදුම් ලබන ලදි. එනමුදු මෙම ජ්‍යෙෂ්ඨ නිළධාරී තම එඩිතර බව තම මව්බිමට පසක් කරමින් මාස 03 ක් වැනි කෙටි කාලයකට පසුව නැවතත් තම සක්‍රිය දායකත්වය යුධ පෙරමුණට ලබාදිමට කටයතු කරන ලදි.

යුද්ධ හමුදාව වෙත රණවිරුවන්ගේ අවශ්‍යතාවය උඡුව තිබූ කාලසිමාවක යුද්ධ හමුදාවට එක්ව කුරිරු ත්‍රස්තවාදයෙන් ලක්මාතාව මුදා ගැනිම සඳහා දියත් කරන ලද ක්‍රියාන්විතයන් ගනනාවක් සඳහා තම දායකත්වය නිර්භයව ලබාදී ඇති මෙම ජ්‍යෙෂ්ඨ නිළධාරී තම සේවාකාලය තුල ලැබූ යුද්ධ හමුදා පදක්කම් වලට අමතරව සතුරු භූමිය තුල දක්වන ලද අභිත රණකාමිත්වය වෙනුවෙන් ලබාදෙනු ලබන රණශූර පදක්කමින්ද පිදුම්ලබා තිබීම මෙහිදී සිහිපත්කල යුතුම කරුණක් ලෙස මා දකිමි.

තවද මෙතුමාගේ සේවාකාලය තුළ දැනුම වර්ධනය කරගැනිම සඳහා දේශිය සහ විදේශිය වශයෙන් පාඨමාලා ගණනාවක් හදාරා එමගින් සුදුසුකම් හා දැනුම් සම්භාරයක් ලබාගත් ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු වන අතර , එම දේශිය පාඨමාලානම් ,

- බණ්ඩහාර නිලධාරි පාඨමාලාව
- සන්නාහ සන්නද්ධ තරුණ නිලධාරි පාඨමාලාව
- ආරක්‍ෂක සේවා අණ හා මාණ්ඩලික පාඨමාලාව වේ.

එමෙන්ම එතුමා හදාරා ඇති විදේශිය පාඨමාලා අතර,

- සන්නහා සන්නද්ධ තරුණ නිලධාරි පාඨමාලාව - ඉන්දියාව
- සන්නහා සන්නද්ධ උපදේශක පාඨමාලාව - ඉන්දියාව
- සන්ග්‍රාමික කණ්ඩායම් අණදෙනන්ගේ පාඨමාලාව - ඉන්දියාව
- සන්නද්ධ බලඇණි අණදෙනන්ගේ පාඨමාලාව - චිනය

තවද මෙතුමා ජාතික ආරක්ෂාව හා උපායමාර්ගික අධ්‍යනය සදහා බංගලාදේශයේ ඉහලම ආයතනයක් වන ජාතික ආරක්ෂක විද්‍යාලයේ උපාදිධාරියෙකි.

හමුදා පාඨමාලාවන්ට අමතරව දේශිය හා විදේශිය ආයතන මගින් අධ්‍යනය කටයුතු සිදුකර ඇති එතුමන්,

- ආයතනික කලමනාකරණ ශ්‍රාස්ත්‍රවේදි උපාදිය - පේරාදේණිය විශ්වවිද්‍යාලය
- ආරක්ෂාව හා සංවර්ධනය පිළිබද ශ්‍රාස්ත්‍රවේදි උපාදිය - බංගලාදේශ ජාතික ආරක්ෂක විද්‍යාලය

යන පාඨමාලා හදාරා ඇත.

එලෙසම උද්යෝගිමත් ක්‍රිඩකයෙකු ලෙස රග්බි ක්‍රිඩාව උදෙසා රෙජිමේන්තු වර්ණයන්ගෙන් පිදුම් ලබන ඔහු ක්‍රිඩාවට දක්වන කැපවිම සහ යුධ හමුදාවේ සුභ සාධනය වෙනුවෙන් දක්වන කැපවිම යුධ පිටියේදි ඔහුගේ විරත්වයට සමාන වේ.

,